බදුල්ල මහා නගර සභාව

බදුල්ල දිස්ත්‍රික්කය

---

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, නගරාධිපතිවරයාට යවා ඇත.

**1.2. <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.8,892,167 ක අසම්භාව්‍ය බැරකම් 01 ක් හා අසම්භාව්‍ය වත්කම් 04 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල අදාල හෙළිදරව් කිරීම් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,050,000 ක ක්‍රීඩාගාර 7 ක් මූල්‍ය ප්‍රකාශන වල රු.4,050,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කරමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,883,710 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් අගරු වූ චෙක්පත් හා ඊට අදාල ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අගරු චෙක්පත් හා ඊට අදාල ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිරවුල් කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර දෙක ඉක්මවූ රු.2,719,977 ක පොදු තැන්පතු 91 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් තැන්පත් මුදල මෙම වර්ෂයේදී සහා අරමුදලට ගැනීමට කටයුතු කරන අතර,ගෙවීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් සභා තීරණයක් ගෙන නැවත ගෙවීමට කටයුතු කරමි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | කඩ කාමර 252 ක් සඳහා නව තක්සේරු වටිනාකම මත බදු අය නොකර 2002 වර්ෂයේදී තක්සේරු කරනලද අගය මත පදනම්ව බදු අය කිරීම නිසා 2019 ජූලි 31 දිනට රු.53,265,050 ක ආදායමක් අහිමි වී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | නව බදු කුලී අයකිරීම සඳහා එක් එක් ස්ථාන අනුව යම් ප්‍රමාණයක් අයකර ගැනීමට සහා අනුමතිය ලැබී ඇත. එම අය කිරීම්ද තාවකාලිකව නතර කර ඇති බව හා නැවත සභා තීරණයක් මත අය කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,820,463 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,835,498 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුග ත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 24,910,000 | 18,278,540 | 12,391,631 | 5,886,909 | 30,427,500 | 16,554,071 | 11,776,524 | 4,777,547 |
| ii. | කුලී | 35,227,000 | 30,006,335 | 26,354,704 | 3,651,631 | 27,599,600 | 25,648,603 | 23,040,353 | 2,608,250 |
| iii | බලපත්‍ර ගාස්තු | 15,120,000 | 17,198,346 | 14,469,153 | 2,729,193 | 16,235,000 | 15,964,360 | 14,350,925 | 1,613,435 |
| iv. | වෙනත් ආදායම් | 60,691,000 | 57,304,655 | 11,449,460 | 45,855,195 | 57,599,000 | 53,793,266 | 15,317,041 | 38,476,225 |
| | එකතුව | 135,948,000 | 122,787,876 | 64,664,948 | 58,122,928 | 131,861,100 | 111,960,300 | 64,484,843 | 47,475,457 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් රු.22,784,193 ක් හා හිඟහිටි වෙනත් ආදායම් රු.76,335,732 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගත යුතුවේ. | 2019 සැප්තැම්බර් දක්වා දේපළ තහනම් කිරීම් මගින් රු.4,943,696 ක වරිපනම් අයකරගෙන ඇත. 2019 වර්ෂයේ බිල්කළ වරිපනම් ආදායමින් රු.12,391,631 ක් අය කරගෙන ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.20,792,750 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.31,327,478 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව දන්වා ඇත. හිඟ මුද්දර ගාස්තු රු.2,051,500 ක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත්කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට පමණක් අවිධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. | විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා විධිමත් පරිදි ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කර ඇත. |

(

**(ආ ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයට අදාල සංවර්ධන වැඩසටහනේ ඇතුලත් කර්තව්‍යයන් 02 ක් සඳහා අයවැය ප්‍රතිපාදන නොසැලසීම නිසා ඇස්තමේන්තු වටිනාකම රු.2,176,592 ක් වූ කර්තව්‍යයන් 02 ක් ඉටුකර නොතිබුණි. | අනුමත සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා ගත යුතුවේ. | සභා තීරණ මත ඉදිරි කටයුතු සිදු නොකරන ලදී. |

(ඇ) <u>ප්‍රතිපාදන සලසා ඇති නමුත් වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයට අදාල සංවර්ධන වැඩසටහන අනුව සංවර්ධන ව්‍යාපෘති 17 ක් සඳහා රු.8,798,536 ක මූල්‍ය ප්‍රතිපාදන සළසා තිබුණද වර්ෂය තුළ එම ව්‍යාපෘති වල වැඩ ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කළ ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කළ යුතුවේ. | සමහර කර්මාන්ත ආරම්භ කර ඇත. තවත් කර්මාන්ත ප්‍රා.ලේ කාර්යාලය මගින් ඉටු කර ඇත. |

(ඈ) <u>අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයට අදාල සංවර්ධන වැඩසටහන අනුව සංවර්ධන ව්‍යාපෘති 7 ක් සඳහා රු.1,953,912 ක මුදලක් වැයකර තිබුණද, අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | ව්‍යාපෘති වල ඉදිකිරීම් නියමිත කාලය තුල අවසන් කළ යුතුවේ. | මෙම වැඩ කොටස් 2019 වර්ෂයේ දෙසැම්බර් වනවිට ආරම්භ කර තිබුණු බව හා භාණ්ඩ ලැබීමේ ප්‍රමාදය මත ඉටු කිරීමට කල් ගත වූ බවට පිළිතුරු ලබාදී ඇත. |

(ඉ) <u>පාරිසරික ගැටළු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තිය අනුව ගෝඝාතක ස්ථානයක් සඳහා පාරිසරික බලපත්‍රයක් ලබාගත යුතු වුවද, ග්‍රීන්ලේන්ඩ්‍රයිව් පාර, බදුලුපිටිය, බදුල්ල යන ස්ථානයේ පිහිටි ගෝඝාතකාගාරය සඳහා එලෙස බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම නිසි පරිදි අප ජලය බැහැර නොකිරීම මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් සභාවට විරුද්ධව මේ සම්බන්ධයෙන් නඩු පවරා තිබුණි. | අදාල පරිසර නීති අනුව කටයුතු කළ යුතුවේ. | දැනට මධ්‍යම පරිසර අධිකාරියෙන් නඩු පවරා ඇත.එම නඩුවේදි මෙය වසා දැමීමට නියෝග කර නොමැත. |

(ඊ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ 'තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030' පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සභාවට අදාල කරගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක සැලසුම සමග ඉදිරි කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේනානායක පිටිය පොදු වැසිකිලිය හා දකුණු පටුමඟ පොදු වැසිකිලිය 2018 වර්ෂය සඳහා බදු දීමට අදාල ගිවිසුමෙහි 30(ඇ)වගන්තිය අනුව 2018 දෙසැම්බර් 31 වන දින ප.ව 6.00 ට පෙර මෙම වැසිකිලි දෙක සභාව වෙත භාරදිය යුතු වුවද, 2019 ජූලි 17 දින දක්වා භාරදී නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගය අනුගමනය කර බදුදීම හා 2019 ජූලි 17 දක්වා හිඟ මුදල් අය කරගැනීම කළ යුතුවේ. | දැනට මෙම වැසිකිලි 02 නැවත පවරාගෙන ටෙන්ඩර් ලබාදී ඇත. හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | බදුල්ල නගරයේ පවත්වාගෙන යනු ලබන සිනමාශාලා දෙකකින් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු.1,756,005 ක හිඟ බදු මුදල් අය කරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | විනෝද බදු මුදල් ගෙවන ලෙස කළමනාකරුට දන්වා ඇති නමුත් ගෙවා නොමැත. නොවිකුණු රිසිට් පොත් සභාව භාරයට ගෙන ඇත. එවැනි අවස්ථාවක හිඟ මුදල් ගෙවීමට පොරොන්දුවී තාවකාලික ගිවිසුමකටද එළඹ ඇත. එහිදී වාරික දෙකක් පමණක් ගෙවා ඉතිරිය ගෙවා නොමැත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක අතිරික්ත 49 ක් පැවති අතර, තනතුරු 41 කට අදාලව පුරප්පාඩු පැවතුනි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල කටයුතු කළ යුතුවේ. | අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව සේවය අතහැර ගිය, වැඩ තහනම් කළ හා ස්ථානමාරුවී ගිය සේවකයින් 51 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,860,214 ක හිඟ ණය ශේෂයක් අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකරගත යුතුවේ. | ණයශේෂ අයකර ගැනීම සඳහා එම නිලධාරින්ට හා ඔවුන්ගේ ඇපකරුවන්ට දන්වා යවා ඇත. පිළිතුරු ලද වහාම අවශ්‍ය කටයුතු කරමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බදුල්ල දකුණු පටුමඟ කඩ කාමර 10 ක් සඳහා බදු ගිවිසුම් වලට එළඹ නොතිබුණු අතර,කඩ කාමර 04 ක ගිවිසුම් කාලය වර්ෂ 14 කට පෙර සිට අවසන්ව තිබුණි. එමෙන්ම කාමර 12 ක් අතුරු බදුදී තිබීම මත රු.2,342,400 ක ආදායමක් අහිමිවී තිබුණි. | අයවිය යුතු ආදායම් අයකරගත යුතු අතර,ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර සඳහා වන ගිවිසුම් අලුත් කිරිමේ කටයුතු සිදු කරමින් පවති. |
| (ආ) | තානායම ඉදිරිපිට පිහිටි බදුදී තිබුණු කඩ කාමර 03 ක ඉහල මහළ බදු ගැනුම්කරු විසින් ඉදිකර තිබුණු අතර, එම මහළ තක්සේරු කර කුලී අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකරගත යුතුවේ. | නැවත සහා තීරණයක් මත අයකිරිමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි. | වර්ෂයටම අදාල වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමත කරගත යුතුවේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. | අවම වශයෙන් කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | කමිටු රැස්වීම් 04 සඳහාම කැඳවීම් කලද නිලධාරින්ගේ පැමිණීම අවම වූ බැවින් එය පැවැත්විමට නොහැකි විය. |